# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1784/8 - 2012 නොවැම්බර් මස 12 වැනි සඳුදා - 2012.11.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ දමන ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම

නැගෙනහිර පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන දමන ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වන වගන්තිය යටතේ, සභාපති වන ඩබ්ලිව්. ඩී. වීරසිංහ නම් වූ සභාපති අයත්වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ දමන ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජාගොඩ ආරච්චිගේ මංගල මහින්ද ගුණවර්ධන මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

දමන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමනියම් අච්චුදන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ජාගොඩ ආරච්චිගේ මංගල මහින්ද ගුණවර්ධන මහතා දමන ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
දමන ප්‍රාදේශීය සභාව.

2012 නොවැම්බර් මස 02 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

11 - 996/1

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ දමන ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

නැගෙනහිර පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන දමන ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඩබ්ලිව්. ඩී. වීරසිංහ නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ දමන ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ඩී. එම්. සිසිල් විජේරත්න මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

දමන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමනියම් අච්චුදන් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඩී. එම්. සිසිල් විජේරත්න මහතා දමන ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
දමන ප්‍රාදේශීය සභාව.

2012 නොවැම්බර් මස 02 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

11 - 996/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.